# 9 හොඳ දරුවෝ

අම්මා : දුව සරෝජා දැන් හයයි කාලයි. ඉක්මනට එන්න. නැත්නම් පරක්කු වෙයි.

සරෝජා : හොඳයි අම්මා, මම ඉක්මනට එනවා. මම සපත්තු දානවා.



අම්මා : දුව බුදුන් වැඳලා කෑම කන්න. තාත්තා ලෑහැස්ති වෙලා පැය කාලකටත් වැඩියි.

සරෝජා : හා! අම්මේ, මම ඉක්මනට එන්නම්.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



(සරෝජා කෑම කනවා.)

**සරෝජා : අම්මේ, මම ගිහින් එන්නම්.**



(සරෝජා අම්මාටත් තාත්තාටත් වැන්දා.)

**අම්මා : දුවට බුදු සරණයි!**

**තාත්තා : දුවට බුදු සරණයි!**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



(තාත්තාත් දුවත් නිවසින් බැහැර වුණා.)

තාත්තා : දුව ඉක්මනට යමු. වෙලාව හතට කාලයි.

සරෝජා : හා! තාත්තේ, ඉක්මනට යමු, තාත්තේ, ඊයේ හතයි කාලේ කෝච්චිය ආවේ නැහැ. උදාරයි මමයි බංකුවේ ඉඳගෙන හිටියා. එතැනට දුප්පත් ආච්චි කෙනෙක් ආවා. මම මගේ කෑම එක දුන්නා.

තාත්තා : කමක් නැහැ දුව. ඒක හොඳ දෙයක්. දුප්පත් අයට උදව් කරන්න ඕනෑ.

සරෝජා : තාත්තේ, ඉතින් ඊළඟ කෝච්චිය ආවේ හතහමාරට. ඒකෙ සෙනග පිරිලා.

තාත්තා : එහෙම තමයි දුව. අනිත් කෝච්චියේ අයත් ඒකෙ එන්න ඇති.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සරෝජා : ඉතින් තාත්තේ, අර කෝච්චියෙන් කලබලයට සෙනග බැස්සා.

තාත්තා : ඉතින්! ඉතින්! දුව.

සරෝජා : අර ආච්චි සෙනග අස්සේ කෝච්චියට නගින්න හැදුවා. ආච්චි තල්ලු වෙලා ගිහින් බිමට වැටුණා.

තාත්තා : ඊළඟට මොකද වුණේ?

සරෝජා : මමයි උදාරයි ආච්චි නැගිට්ටවලා බංකුවේ ඉන්දෙව්වා.
ආච්චිට වතුර එහෙම දුන්නා.

තාත්තා : හොඳ දුව. එහෙම තමයි කාට හරි කරදරයක් වුණා ම උදව් කරන්න ඕනෑ.

සරෝජා : අපි ඊයේ ඉස්කෝලෙ යනකොට පරක්කු වෙලා. අපි හතයි හතළිස් පහට තියෙන කෝච්චියේ තමයි ගියේ.



(දෙදෙනා දුම්රියපොළට ළඟා වුණා.)

සරෝජා : තාත්තේ, අර බංකුවේ ඉඳගෙන ඉන්නෙ උදාර.

තාත්තා : අපි එතනට යමු දුව.

සරෝජා : තාත්තේ, මේ උදාර. මගේ කණ්ඩායමේ තමයි ඉන්නේ. අපි දෙන්නා තමයි ආච්චිට උදව් කළේ.
උදාර ආයුබෝවන් !
උදාර බංකුවෙන් නැගිට්ටා.

උදාර : ආයුබෝවන් සරෝජා !
ආයුබෝවන් මාමේ !



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



තාත්තා : ආයුබෝවන් පුතා! ඊයේ ඔයාලා කරලා තියෙන්නේ හොඳ දෙයක්. ඉතින් පුතා ඔයාලා හොඳින් පාඩම් කරනවා ද?

උදාර : ඔව්, අපි හොඳට පාඩම් කරනවා.

සරෝජා : තාත්තේ, උදාර තමයි පන්තියේ නායකයා. හොඳට වැඩත් කරනවා.

තාත්තා : එහෙම තමයි පුතා; තමන්ට පැවරෙන වගකීම හරියට ඉටු කරන්න ඕනෙ. ඒ වගේම ඉගෙන ගන්නත් ඕනෑ.

සරෝජා : ආ. . . උදාර ඊයේ මම ඉල්ලගත්ත පැන්සල මට දෙන්න අමතක වුණා. තරහා වෙන්න එපා.

උදාර : ඒකට කමක් නැහැ. ඔයා තියාගන්න. මට තව පැන්සල් තියෙනවා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



තාත්තා : ආ . . . .දුව ඔයා පොත ගන්න ඉල්ලුව සල්ලි. ඕනෙ නම් පොත් දෙකක් ම ගන්න.

සරෝජා : අන්න, අද හතයි කාලට ම කෝච්චිය එනවා. අපි ගිහින් එන්නම්.

තාත්තා : ඔයාලා පරිස්සමෙන් යන්න.
දුව,දෙකයි කාලේ කෝච්චියේ එන්න.
මම දෙකහමාරට මෙතනට එනවා.
ඔයාලාට බුදු සරණයි!

සරෝජා : බුදු සරණයි තාත්තේ!



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 1

(i) චරිත වෙන්කර ගනිමින් පාඩම ශබ්ද නගා කියවන්න.

(ii) සරෝජා පාසල් යාමට පෙර කළ දේවල් මොනවාද?

(iii) සරෝජා දුම්රියපොළට ගියේ කා එක්ක ද?

(iv) දුම්රියපොළට යනකොට සරෝජා කියූ විස්තරය කුමක් ද?

(v) සරෝජාට දුම්රියපොළේ දී හමුවුණේ කවුද?

## ක්‍රියාකාරකම 2

අම්මා සරෝජාට කතා කළ වේලාව ඔරලෝසුවේ දක්වෙනවා.





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අපි ඔර්ලෝසුවේ කටු මෙහෙම තියෙනවා දැක්ක ම කියන්නෙ හයයි කාලයි කියලා. පහත සඳහන් වේලාවන් දැක්වෙන පරිදි ඔර්ලෝසු මුහුණත් අඳින්න.

7. 15 - හතයි කාලයි. / හතයි පහළොවයි.

7. 30 - හතහමාරයි. / හතයි තිහයි.

## ක්‍රියාකාරකම 3

මේ ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) සරෝජාට අම්මා කතා කළේ කීයට ද?
(ii) සරෝජා ගෙදරින් ගියේ කීයට ද?
(iii) සරෝජා පාසල් යන දුම්රිය ආවේ කීයට ද?
(iv) සරෝජා ආපසු එන්නේ කීයට තියෙන දුම්රියේ ද?
(v) තාත්තා නැවත දුම්රියපොළට එන්නේ කීයට ද?

## ක්‍රියාකාරකම 4

පහත දැක්වෙන වේලාවන් කියන විධිය ලියා දක්වන්න.

(i) 9. 30

(ii) 10. 15



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iii) 11. 30

(iv) 12. 15

(v) 1. 45

## ක්‍රියාකාරකම 5

කොටු තුළ ඇති වචනවලට විශේෂ අවධානය යොමු කරමින් පහත දී ඇති වගන්ති කියවන්න.

★ ආ . . . දුව ඔයා පොත ගන්න ඉල්ලුව සල්ලි.

සරෝජාට තාත්තා දුන්නේ පොත ගන්න සල්ලි.

★ ඕනෙ නම් පොත් දෙකක් ම ගන්න.

කැමති නම් පොත් දෙකක් ම ගන්න කියලා

තාත්තා කියනවා.

පොත - පොත්

**"පොත" කියන්නේ එක පොතක්. "පොත්" කිව්ව ම පොත් දෙකක් හෝ වැඩි ගණනක්. ඒ වගේ තවත් පද හඳුනාගන්න.**

| **එකක් / ඒකවචන** | **වැඩි ගණනක් / බහුවචන** |
|---|---|
| මාලය | මාල |
| ළමයා | ළමයි |
| ගෙඩිය | ගෙඩි |

## ක්‍රියාකාරකම 6

පහත සඳහන් වගුව අභ්‍යාස පොතේ පිටපත් කරගන්න. පාඩමේ එන ඒකවචන සහ බහුවචන නාම පද එම වගුව තුළ ලියන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 7

පහත දැක්වෙන වගුව අභ්‍යාස පොතේ පිටපත් කර ගන්න. ඔබ පාඩමෙන් සොයා ගත් ඒකවචන පද ලියා ඒවාට ගැළපෙන බහුවචන පදත්, බහුවචන පද ලියා ඒවාට ගැළපෙන ඒකවචන පදත් ලියන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

## ක්‍රියාකාරකම 8

උදාහරණ දෙස බලා පහත දැක්වෙන පදවල බහුවචන පද ලියන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| අම්මා | අම්මලා |
| තාත්තා | |
| මල්ලි | |
| නංගි | |
| නැන්දා | |
| ගුරුතුමා | |

| ඒකවචන | බහුවචන |
|---|---|
| පාසල | පාසල් |
| පෑන | |
| ලියුම | |
| නැව | |
| පහන | |
| ගස | |

| ඒකවචන | බහුවචන |
|---|---|
| ළමයා | ළමයි |
| ගිරවා | |
| අලියා | |
| කොටියා | |
| නරියා | |
| රිළවා | |

| ඒකවචන | බහුවචන |
|---|---|
| ඇතා | ඇත්තු |
| ගොනා | |
| වලසා | |
| මිනිසා | |
| ලේනා | |
| එළදෙන | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| ඒක වචන | බහුවචන |
| --- | --- |
| කොල්ලා | කොල්ලෝ |
| බල්ලා | |
| කෙල්ල | |
| පූසා | |
| හාවා | |
| දරුවා | |

## ක්‍රියාකාරකම 9

(i) ඒකවචන, බහුවචන පද එකතු කරන්න.

(ii) ඒවා ඒක වචන බහුවචන පද වශයෙන් වගු ගත කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.